**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.27 සිට 3.32 ජේදයන්ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | යොමුගත ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

1.6.2 **ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) පෙර වර්ෂවල ලද ප්‍රාග්ධන ප්‍රදානවලට අදාල වාර්ෂික ක්ෂය ලෙස රු.8,832,714 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමට හඳුනාගත යුතු වුවත්, රු.32,614 ක් පමණක් ආදායමට හඳුනාගෙන තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) රු.2,162,822 ක් වූ මනින්ගමුව 4 වන පටුමඟ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය හා රු.290,093 ක් වූ ගම්මන්පිල අරුණ සුහසිංහ මාවත සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ මුදල් ලැබී තිබුණද මූල්‍ය ප්‍රකාශනවල ණයගැති ශේෂ ලෙස පිළිවෙලින් රු.216,282 ක් හා රු.290,093 ක් දක්වා තිබුණි. | වර්ෂය අවසානයේදී නිවැරදි කරන බව. | -එම-. |

| | | |
|---|---|---|
| (ඈ) පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ මෛත්‍රී නගර ශාලාව අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.6,535,524 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.7,081,976 ක් ලෙස දක්වා තිබුණි. | -එම-. | -එම-. |
| (ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ලද රු.9,012,060 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ ලද ප්‍රාග්ධන ප්‍රදාන ලෙස දැක්වීම වෙනුවට අතිරික්තයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස දක්වා තිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරිමේදී නිවැරදි කරන බව. | -එම-. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය | කාලානුරූපීව සභා බල ප්‍රදේශයේ නව සංවර්ධන ප්‍රදේශ හඳුනාගෙන නියමිත පරිදි ගැසට් කර වරිපනම් බදු අය කිරිමට කටයුතු කර නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ ලෙස නිකුත් කළ ගැසට් නිවේදනය සභාව සතුව නැති බව. | යොමුගත රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 15 ක ඉන්ධන දහන පරික්ෂාව චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සිදු කර නොතිබුණි. | ඉන්ධන අර්බුදය නිසා පරික්ෂාව සිදු කළ නොහැකි වු බව. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.78,802,975 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.68,792,224 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම්හා බදු | 6,874,690 | 7,432,910 | 6,960,442 | 6,781,262 | 6,686,200 | 7,594,881 | 6,663,491 | 931,390 |
| (ii) | කුලී | 5,449,210 | 5,850,913 | 5,140,183 | 710,730 | 9,818,600 | 5,628,435 | 4,504,119 | 1,124,316 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 183,000 | 444,000 | 444,000 | - | 380,000 | 356,000 | 356,000 | - |
| (iv) | වෙනත් ආදායම් | 151,963,259 | 56,692,259 | 42,651,155 | 14,041,103 | 112,563,300 | 38,691,300 | 17,883,032 | 20,808,268 |
| | | 164,470,159 | 70,420,082 | 55,195,780 | 21,533,095 | 129,448,100 | 52,270,616 | 29,406,642 | 22,863,974 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කායර්සාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| 2023 ජනවාරි 01 දිනට වරිපනම් බදු හිඟය රු.2,889,615 ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.1,295,867 ක් හෙවත් සියයට 45 ක් අයකර නොතිබුණි. | 2024.03.31 වන විට රු.181,373 ක් අයකර ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) වෙනත් ආදායම්** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 3,613,470ක් හා මුද්දර ගාස්තු රු.79,000 ක් විය. | උපලේඛන සකස් කරමින් පවතින බව. | -එම- |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය

යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 මැයි 22 දින සිට දෛනිකව එකතුවන දිරන කසළ ප්‍රමාණයෙන් ටොන් 03 ක් මිල්ලනිය ප්‍රාදේශිය සභාවේ දෙල්දොරවත්ත කසළ අංගනය වෙත යැවීම ආරම්භ කර තිබුණද බල ප්‍රදේශය තුල විශාල කසළ ප්‍රමාණයක් ජනනය වීමත්, සභාව සතුව කසළ අංගනයක් නොතිබීමත් නිසා කසළ බැහැර කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල පුද්ගලික සමාගමක් වෙත රු.6,044,000 ක් ගෙවා තිබුණි. | දිරන කසළ ටොන් 03 ක් මිල්ලනිය ප්‍රාදේශීය සභාවට ලබාදෙන බැවින් පුද්ගලික සමාගමට කරන ගෙවීම් අඩුවී ඇති බව හා නොදිරන කසළ INCE ආයතනයට යවන බව. | ගෘහස්ථ කොම්පොස්ට් බඳුන් ආදිය ලබා දී දිරන කසළ රැස් කිරීම අවම කිරීමටත් එකතු වන කසළ කොම්පෝස්ට් නිෂ්පාදනයටත් යෙදවීමට අවධානය යොමු කළ යුතුය. |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවෙන් වෙනම ඒකකයක් ලෙස 2018 පෙබරවාරි 11 දින මිල්ලනිය ප්‍රාදේශීය සභාව ස්ථාපිත කර තිබූ අතර වසර 06 කට ආසන්න කාලයක් ගතවී තිබුණද රු.35,663,712 ක් වූ හිඟ මුදල් ගෙවා වත්කම් බෙදීම නිරවුල් කරගෙන නොතිබුණි. | මෙම මුදල කොපමණ වාරික ප්‍රමාණයකින් ගෙවිය යුතුද යන්න කළුතර පළාත් පාලන කොමසාරිස් විසින් ඉදිරිපත් කරන ගිවිසුම අනුව තීරණය වන බව. | හිඟ මුදල් ගෙවා වත්කම්, වගකීම් බෙදීම කඩිනම් කළ යුතුය. |
| (ආ) සභාව විසින් 2006 වර්ෂයේ සහ 2011 වර්ෂයේ ලබාදී තිබූ පිළිවෙලින් රු.14,788 ක් හා රු.50,000 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේත් පියවා ගැනීමට කටයුතු කර නොතිබූ අතර 2000 වර්ෂයට පෙර සිට පැවත එන විස්තර සොයාගත නොහැකි අත්තිකාරම් ශේෂය රු.4,159,923 ක් විය. | රු.14,789 ට අදාලව තොරතුරු සොයා ගැනීමට නොහැක. රු.50,000 ට අදාල අත්තිකාරම් සී/ස බණ්ඩාරගම විවිධ සේවා සමුපකාර සමිතිය විසින් පියවීමට නොහැකි බව දන්වා ඇති අතර රු.4,159,923 ට අදාල විස්තර කිසිවක් සොයාගත නොහැකි බව . | අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීම පිළිබඳව කඩිනමින් පියවර ගත යුතුය. |
| (ඇ) 2012 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පවතින එකතුව රු.140,906,270 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂයේත් නිරවුල් කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිරවුල් කිරිමට කටයුතු කරන බව. | දිගු කාලීන ණයහිමි ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතුය. |

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කුලිය රු.92,429 ක් වූ කඩ කාමර අංක 22 හි අයිතිකරු විසින් සභාවට දැනුම් දීමකින් තොරව කඩය රු.17,000 ක මාසික කුලියට වෙනත් පාර්ශවයකට අතුරු බදු දී තිබුණද, සභාව විසින් හිඟ කඩ කුලී නොගෙවීම හා කඩය අතුරු බදුදීමට එරෙහිව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | ගාස්තුවකින් තොරව කඩ කාමරයක් ලබාදෙන ලෙස නඩු පවරා ඇති බවත්, තීරණයෙන් පසු අතුරු බදු දීමට එරෙහිව ක්‍රියා කරන බව. | කඩකුලී ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) රු.940,140 ක ස්ථාවර වත්කම් මිලදී ගෙන ආරම්භ කරන ලද ගමේ කඩේ අලෙවි සැල දිගින් දිගටම අලාභ ලබමින් තිබූ අතර මෙම ව්‍යාපෘතියේ ක්‍රමවේදයන් සංශෝධනය කර විකල්ප ක්‍රියා මාර්ග වෙත යොමු වීමට කටයුතු කර නොතිබුණි. | කඩිනම් ක්‍රියා මාර්ග ගැනීමට නියමිත බව. | වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කර ආදායම් උපයාගත යුතුය. |

3.4 **නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගල් රෝල් දෙකක් 2017 වර්ෂයේ සිටද, එක් ගල් රෝලක් 2020 වර්ෂයේ සිටද, බැකෝ ලෝඩරය 2021 වර්ෂයේ සිටද අක්‍රියව පැවති අතර 2023 දෙසැම්බර් 31 වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි. | නියෝජිත ආයතනය වෙතින් මිල ගණන් කැඳවා ඉදිරියේදී අළුත්වැඩියා සිදු කිරිමට කටයුතු කරන බව. | අළුත්වැඩියා කටයුතු සිදු කර වත්කම් කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |
| (ආ) සභාව සතු අත් ට්‍රැක්ටර් 02 ක් සහ මෝටර් බයිසිකලයක් අපහරණය සඳහා හඳුනාගෙන 2023 මැයි 23 අපහරණ කමිටුවක් ද පත් කර තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කටයුතු සිදු කර නොතිබුණි. | සුදුසුකම් රහිත කමිටුවක් නිසා වැඩ ප්‍රමාද වී ඇති බැවින් නැවත කමිටුවක් පත් කර ඉදිරි කටයුතු සිදු කරන බව. | සුදුසුකම් සහිත කමිටුවක් පත් කර අපහරණ කටයුතු කඩිනමින් කළ යුතුය. |

3.5 **වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1946 අංක 57 දරන පොදු සුසාන හා පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 10 වගන්තිය ප්‍රකාරව සුසානභූමිවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට මායිම් සකස් කළයුතු වුවත්, සභාව සතු කිසිදු සුසාන භූමියක වැට මායිම් සකස් කර නොතිබුණු අතර | අයිතිය පවරා ගැනීමට 2023.08.04 දින බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇත. මෙතෙක් අයිතිය නැති බැවින් වැට මායිම් සකස් කර නැති බව. | ඉඩම්වල අයිතිය පවරාගෙන ආරක්ෂිත වැට මායිම් සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| සුසානභූමි 25 ක හිමිකම සභාව වෙත පවරාගෙන නොතිබුණි. | | |
| (ආ) සභාව සතු කැබ් රථ 02 සභාව නමට පවරාගෙන නොතිබුණි. | අංක PE-7465 දරන රථයේ අයිතිය මාරු කිරිමට 2023. 12.06 දින මෝටර් රථ දෙපාර්තමේන්තුවට භාරදී ඇති බවත් අංක 53-4613දරන රථයට අදාල විස්තර නොමැති හෙයින් ප්‍රමාද වී ඇති බව. | සභාව සතු වත්කම් සභාව නමට පවරා ගත යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මියගිය, සේවය හැරගිය, විශ්‍රාම ගිය හා වැඩ තහනම් කළ නිලධාරින් 11 දෙනෙකුගෙන් එකතුව රු.1,166,832 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | මියගිය සේවකයින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.14,800 , විශ්‍රාමික පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරන අතර සේවය හැර ගිය අය වෙත ලිපි යැවුවද ප්‍රතිචාර දක්වා නැති බව. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුය. |